# 4 දෙවිඳුන්ගෙන් විසඳුම්

ශු. ජොහාන් 2 : 1-11

## සරණ මංගල්‍යයක ප්‍රාතිහාර්යයක්

ජුදෙව් සමාජයේ විවාහ මංගල්‍යයන් සඳහා හිමි වූයේ සුවිශේෂී වැදගත්කමකි. ජුදෙව්වෝ විවාහ මංගල්‍යයක් දින හතක් පුරා පැවැත්වූහ. මේ දින හත පුරා විවාහ චාරිත්‍ර ඉටුකරමින් සතුට භුක්ති විඳීමට මනාලයා හා මනාලිය ද සහභාගි වූහ. මෙම දින හත පුරා මංගල්‍යයට පැමිණ සිටින සියලු දෙනාගේ අවශ්‍යතා ඉටුකිරීමට අපොහොසත් වුව හොත් එය ඔවුන් සමාජය ඉදිරියේ ලබන විශාල අවමානයකි. එනිසා මෙම දින හත උත්සවශ්‍රීයෙන් සමරමින් සියලු අමුත්තන් පිනවීමට ජුදෙව්වෝ වගබලා ගත්හ.

ජේසුස්වහන්සේට, උන්වහන්සේගේ මෑණියන්ට හා ශ්‍රාවකයන්ට ගලීලයේ කානා නුවර පැවැත්වූ විවාහ මංගල්‍යයකට සහභාගි වීමට ආරාධනා ලැබිණි. එහි දී සිදු වූ විශේෂ සිදුවීමක් ශුද්ධ බයිබලයෙන් විමසා බලමු.



**විමසා බලමු**
**ශු. ජොහාන් 2 : 1 - 11**

ශුභාරංචි පොත් අතරින් කානා නුවර පිළිබඳ ව සඳහන් කරන එක ම ශුභාරංචිය ශුද්ධ වූ ජොහාන් තුමාගේ ශුභාරංචිය වේ. ඒ, එතරම් වැදගත්කමක් ඇති නගරයක් ලෙස ජුදෙව්වන් කානා නුවර නොසැලකූ හෙයිනි. එවන් නුවරක් ජේසුස් වහන්සේ තම ප්‍රථම ප්‍රාතිහාර්යය සඳහා තෝරා ගැනීම ද වැදගත් වේ.

ජුදෙව් සරණ මංගල්‍යයක දී මෙවැනි ගැටලුවක් ඇති වූ විට එම මංගල්‍යයට සම්බන්ධ අය මුහුණපාන තත්ත්වය පිළිබඳ ව අවබෝධයෙන් පසු වූ ජේසුස් වහන්සේගේ මෑණියෝ ඒ බව උන්වහන්සේට දන්වූහ.

එම දැනුම් දීම නිසා අවමානයකට ලක්වන්නට ගිය නිවැසියන් ඉන් මුදවා ගනිමින් ජේසුස් වහන්සේ මහත් ප්‍රාතිහාර්යයක් සිදු කළ සේක. ගැටිය දක්වා ගල් භාජන හයකට ජලය පුරවන්නැයි උන්වහන්සේ පැවසූ සේක; ඒවා සංවිධායක තැන වෙත ගෙන යන්නට කී සේක. පුදුමයකි! එම ජලය මිදියුෂ බවට පත් ව තිබිණි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.



4.1 රූපය - කානාහි සරණ මංගල්‍යය

කානාහි සරණ මංගල්‍යයේ දී මරියතුමිය, ජේසුස්වහන්සේ විසින් එම ගැටලුවට විසඳුම් ලබා දෙන බව විශ්වාස කළා ය. තම පුත්‍රයා දේව පුත්‍රයා ලෙසට ඈ හඳුනාගෙන සිටි බව එයින් අපට පැහැදිලි වේ. ඈ උන්වහන්සේ තුළ විශ්වාසයෙන් බැඳුණා ය. ඇය සේවකයන්හට පැවසුවේ ජේසුස් වහන්සේ කියන ඕනෑ ම දෙයක් ඉටු කරන ලෙස ය. තමා විශ්වාස කළා පමණක් නොව, ඕ සේවකයන් තුළ ද ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය ගොඩ නැගුවා ය.

අප ජීවත් වන සමාජයේ ඇති වන අර්බුද මැද දේව පුත්‍රයා වූ ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීම තුළ උන්වහන්සේගේ පිහිට අපේක්ෂා කිරීමට මරියතුමී අපට ආදර්ශයක් ගෙන දෙයි.

ජීවිතයේ සැම අවශ්‍යතාවක දී ම ජේසුස්වහන්සේට ආරාධනා කරමින් උන්වහන්සේගේ සහභාගීත්වයට ඉඩ සැලසීම දේව දරුවන්ගේ වගකීම වේ. උන්වහන්සේ සැම මොහොතක ම ලොකු කුඩා අප සැමගේ ආරාධනා පිළිගන්නා සේක. උන්වහන්සේ අප සමග වැඩ සිටීම තුළින් අපගේ ජීවිතවලට මහත් ආලෝකයක් හා ශක්තියක් ලැබේ.

එසේ ම ජීවිතයේ සියලු ම කාරණාවල දී ජේසුස් වහන්සේට අවනත වීමට මෙම සිදුවීමෙන් අපට මඟපෙන්වයි. මිදි යුෂ හිඟ වූ බව දැනගත් මරියතුමිය ජේසුස් වහන්සේට ඒ බව දැනුම් දුන් විට ජේසුස් වහන්සේ ඇයට පැවසුවේ ඔවුන් ඒ පිළිබඳ ව කරදර නොවිය යුතු



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

බවත් උන්වහන්සේගේ මොහොත තව ම පැමිණ නැති බවත් ය. ලෞකික දිවියේ කාරණා පිළිබඳ ව කරදර නොවී දේව පුත්‍රයා වූ ජේසුස් වහන්සේ දෙස විශ්වාසයෙන් බලා සිටීමට තම මව යොමු කිරීමට ජේසුස් වහන්සේ ක්‍රියා කරන අයුරු පැහැදිලි ව කැපීපෙනේ.

**අප ද මරිය තුමිය මෙන්**

- අපගේ ජීවිත ගැටලු හා අවශ්‍යතා ජේසුස් වහන්සේ වෙතට ගෙන එමු.
- අපගේ ජීවිත ගැටලුවල දී කරදර නොවී ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව විශ්වාස කරමින් උන්වහන්සේ මත රැඳී සිටිමු.
- ජේසුස් වහන්සේට විශ්වාසයෙන් කීකරු වෙමින් උන්වහන්සේ පවසන දේට අවනත ව උන්වහන්සේට අප ජීවිතවල මහත් දේ කිරීමට ඉඩ හරිමු.

මරියතුමියගේ ක්‍රියාකලාපය විමසා බැලූ අපි එම සරණ මංගල්‍යයේ දී මෙහෙකරුවන් ක්‍රියා කළ අයුරු විමසා බලමු.

එම ස්ථානයේ තිබුණේ ජුදෙව්වරුන්ගේ පවිත්‍රවීමේ වත්පිළිවෙත් සඳහා ලීටර සියයක් පමණ අල්ලන ගල් භාජන හයක් පමණි. වත්පිළිවෙත් පිළිබඳ ව වඩාත් උනන්දු වූ ජුදෙව්වරු සිය පවිත්‍රත්වය හා පාරිශුද්ධත්වය ගැන බෙහෙවින් සැලකිලිමත් වූහ. ජුදෙව්වරයකු යම් ගෙදරකට ඇතුළු වූ කල සේවකයකු විසින් පාද සේදීම සුලභ ව පැවති ජුදෙව් චාරිත්‍රයකි. එසේ ම අත් හා බඳුන් සේදීමට වෙන ම ජලය පිරවූ බඳුන් තබා තිබිණ. මෙම සේවකයන් ද එම බඳුන් සූදානම් කර තබා තිබුණේ එම පිළිවෙත් ඉටුකිරීම සඳහා බව සඳහන් වේ.

මෙම සේවකයන් ජේසුස් වහන්සේ පැවසූ ආකාරයට භාජනවලට වතුර පිරවූ කල එම මහා ප්‍රාතිහාර්යය සිදු විය. ජේසුස්වහන්සේට කීකරුවීමෙන් මහත් හාස්කමක් අත්දැකීමට ඔවුන්ට හැකි විය. හිස් ගල් භාජන හයකට ඒවායේ ගැටිය දක්වා ජලය ලීටර හයසියයක් පමණ පිරවූ එම සේවකයන් කීකරුකමේ ආශීර්වාදයට ඇතුළත්වූ බව පැහැදිලි ය. ජේසුස් වහන්සේ පවසන දේට අවනත වීමට මින් අපට මඟපෙන්වයි. ඒ තුළින් මහත් ආශීර්වාද ගලා එනු ඇත. ජේසුස් වහන්සේ මෙම අර්බුද අවස්ථාවේ හාස්කමක් සිදුකළ සේක. ඕනෑ ම අර්බුදයක්, ගැටලුවක් උන්වහන්සේට මොහොතකින් වෙනස් කළ හැකි බව විදහා දක්වූ සේක.

උන්වහන්සේ කානාහි සරණ මංගල්‍යයේ සිටිමින් එහි ඇතිවූ අර්බුදය සැණෙකින් විසඳූ අයුරු විස්මිත ය. ගල්භාජන හයක් ගැටිය දක්වා ජලය පිරවූ සේවකයන් දේව වැඩ සිටීමේ අත්දැකීමට ඇතුළත් වුවා පමණක් නොව සරණ මංගල්‍යයේ සංවිධායක ද එම අත්දැකීමට කැඳවීමට යුහුසුළු විය.

අප දේව බලය අත්දකිමින් එම අත්දැකීම් අන් අය වෙතට ද ගලායාමට හැකි උල්පත් වීම දේව අපේක්ෂාවයි. එවිට අපගේ ආධ්‍යාත්මික ජීවිත වෙනස් වේ.

ජේසුස් වහන්සේට අපගේ ජීවිතය තුළ වඩාත් බලවත් දේ කිරීමට ඉඩහරිමින් කීකරු වීමෙන් වඩාත් ගැඹුරු ආධ්‍යාත්මික අත්දැකීම් ලැබීමට අපට හැකියාව ලැබේ. මෙහි දී ඔවුහු ද දේව වැඩ සිටීම හා සමීපත්වය අත් දුටහ.

එදිනෙදා ජීවිතයේ දී දේව වැඩ සිටීම අත්දැකීම තුළ අප ආධ්‍යාත්මික ජීවිත පූර්ණත්වයට පත්වේ. දෙවියන් වහන්සේගේ සැලැස්මට අනුව ඉතා උසස් හා හොඳ ම දේ උන්වහන්සේ අප ජීවිතවල සිදුකරන සේක. එවිට ඊට පෙර පැවති දෙයට වඩා වටිනාකමින් වැඩි යමක් අත්දැකීමට අපට අවකාශ ලැබේ. ජේසුස් වහන්සේ කානාහි සරණ මංගල්‍යයේ දී,

1. වතුර මිදියුෂ කිරීමෙන් මහත් ප්‍රාතිහාර්යයක් සිදු කළ සේක.
2. දෙවියන් වහන්සේගේ මහත් බලය ජේසුස්වහන්සේ සතු ව පවතින බව ප්‍රකාශ විය.
3. මනාල යුවල ලෞකික අවමානයෙන් ආරක්ෂා විය.
4. සේවක පිරිසගේ අවනත භාවය ඉස්මතු විය.
5. දෙවිඳුන්ගේ කරුණාව තුළ අර්බුද ජයගත හැකි බව අවබෝධ විය.
6. ශ්‍රාවකයන්ගේ ඇදහිල්ල වර්ධනය විය.
7. මරියතුමිය හා සේවකයින්ගේ කීකරුකම තුළින්, එම මංගල්‍යයේ අවශ්‍යතාව සම්පූර්ණ විය.

ජීවිතයේ විවිධ අවශ්‍යතාවල දී දේව වැඩ සිටීම අත්දකිමින් ජේසුස් වහන්සේ වෙත යොමුවීමට අදත් උන්වහන්සේ අපට ආරාධනා කරන සේක. එම ආසිරි ලබමින් අන් අය කෙරෙහි සංවේදී වීම හා අන් අයගේ අවශ්‍යතාවල දී උපකාර කිරීමට ඉදිරිපත් වීම උන්වහන්සේ කිතුනු අප සැමගෙන් අපේක්ෂා කරන සේක.

**ක්‍රියාකාරකම්**

1. කානාහි සරණ මංගල්‍යයේ එක් අවස්ථාවක් දෙබසක් ලෙස ඉදිරිපත් කරන්න.
2. කානාහි සරණ මංගල්‍යයේ විවිධ අවස්ථා මගින් ඔබට ලද හැකි ආදර්ශ **පහක්** ලියා දක්වන්න.